අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/12/11/02/02

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2020.05. 26

චක්‍රලේඛ අංකය : 16/2020

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පාසල්වල විදුහල්පතිවරුන් වෙත,

**පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම.**

පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති 2019.05.24 දිනැති අංක 29/2019 දරන චක්‍රලේඛය සහ 2019.07.11 දිනැති අංක 29/2019(I) දරන චක්‍රලේඛ සංශෝධනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

උක්ත චක්‍රලේඛවල සඳහන්, පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමට අදාළ විධිවිධාන කිහිපයක් 2021 වර්ෂයට හා ඉන් ඉදිරියට බලපැවැත්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**පහත දැක්වෙන එම සංශෝධනයන්ට අනුව මින් ඉදිරියට කටයුතු කළ යුතු අතර, ඉහත චක්‍රලේඛවල මෙමඟින් සංශෝධනය නොවන විධිවිධාන ඒ ආකාරයෙන් ම බලපවත්වනු ඇත.**

7.2.1.1. පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන යටතේ "වෙනත් පිළිගත හැකි ලේඛන - ලකුණු 04" යන වගන්තියට පසුව ඊළඟ වගන්තිය ලෙස පහත වගන්තිය ඇතුළත් කෙරේ.

✓ පදිංචි ස්ථානය තහවුරු කිරීමට ඉහත දක්වා ඇති කිසිදු ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන එහෙත් කිසිදු ආසන්න පාසලක් සඳහා ලකුණු නොකැපෙන, අයදුම්කරු/කලත්‍රයාට අදාළ ලිපිනයෙහි පූර්වාසන්න වර්ෂ 5ක ඡන්ද ලියාපදිංචිය ඇති, අයදුම්කරු/කලත්‍රයා උපන් දා සිට අදාළ ස්ථානයේ පදිංචි බවට තහවුරු කළ හැකි (උප්පැන්න සහතිකය, අස්වීම් සහතිකය... ආදිය මඟින්) විවාහයෙන් පසු ද මේ දක්වා ඉල්ලුම් කරන ලිපිනයේ ම පදිංචි ව සිටින බවට තහවුරු කරන අයදුම්කරුවන්ට - ලකුණු 15
මෙහි දී, ඉහත කරුණු පාසල් සම්මුඛ පරීක්ෂණ කමිටුව විසින් විධිමත් ව පරීක්ෂා කර නිසි පරිදි තහවුරු කරගෙන ලකුණු ලබා දිය යුතු අතර වෙනම ලේඛනයක එම අයදුම්කරුවන්ගේ තොරතුරු සටහන් කර තබාගත යුතු ය. එසේ ම, මේ සම්බන්ධ ලොග් සටහන් ද තබාගත යුතු ය.

7.2.1.1 වගන්තිය අවසානයේ සඳහන්, " **මෙම ගණය යටතේ පදිංචියට අදාළ ප්‍රධාන ලේඛන ඇත්නම් පමණක් මින් ඉදිරියට ඇති කොටස් සඳහා ලකුණු ලබා දිය යුතු ය.**" යන ඡේදය ඉවත් කෙරෙන අතර, ඒ වෙනුවට පහත ඡේදය ඇතුළත් කෙරේ.

**"මෙම ගණය යටතේ ඉහත කරුණුවලට අදාල ව පදිංචිය තහවුරු කිරීම සඳහා හිමිවන ලකුණු උපයා ඇති අයදුම්කරුවන්ට පමණක් මින් ඉදිරියට ඇති කොටස් සඳහා ලකුණු ලබා දිය යුතු ය."**

7.2.2 හි 7.2.2.1 වගු අංක (I) හි වගන්ති අංක (I) "මව හා පියා යන දෙදෙනාගේ / නීත්‍යානුකූල භාරකරුගේ නම වර්ෂ 05ක් ලියාපදිංචි වී තිබේ නම් - ලකුණු 25" යන්න ඉවත් කෙරෙන අතර, ඒ වෙනුවට පහත වගන්තිය ඇතුළත් කෙරේ.

මව හා පියා යන දෙදෙනාගේ / නීත්‍යානුකූල භාරකරුගේ නම වර්ෂ 05ක් ලියාපදිංචි වී තිබේ නම් <u>හෝ</u> මව/ පියාගේ නම වර්ෂ 5ක් ද, විවාහය ලියාපදිංචි කර වර්ෂයක් ඇතුළත කලත්‍රයාගේ නම ඡන්දහිමි නාම ලේඛනයේ ඇතුළත් කිරීමට අයදුම් කර ඇත්නම් සහ ඉන් අනතුරුව

අඛණ්ඩව වර්ෂ 04 ක් කලත්‍රයාගේ නම ද ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී තිබේ නම් - ලකුණු 25

7.4.2 පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛන යටතේ "වෙනත් පිළිගත හැකි ලේඛන - ලකුණු 02" යන වගන්තියට පසුව ඊලඟ වගන්තිය ලෙස පහත වගන්තිය ඇතුළත් කෙරේ.

✓ පදිංචි ස්ථානය තහවුරු කිරීමට ඉහත දක්වා ඇති කිසිදු ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන එහෙත් කිසිදු ආසන්න පාසලක් සඳහා ලකුණු නොකැපෙන, අයදුම්කරු/කලත්‍රයාට අදාළ ලිපිනයෙහි පූර්වාසන්න වර්ෂ 5ක ඡන්ද ලියාපදිංචිය ඇති, අයදුම්කරු/කලත්‍රයා උපන් දා සිට අදාළ ස්ථානයේ පදිංචි බවට තහවුරු කළ හැකි (උප්පැන්න සහතිකය, අස්වීම් සහතිකය... ආදිය මඟින්) විවාහයෙන් පසු ද මේ දක්වා ඉල්ලුම් කරන ලිපිනයේ ම පදිංචි ව සිටින බවට තහවුරු කරන අයදුම්කරුවන්ට - ලකුණු 06

මෙහි දී, ඉහත කරුණු පාසල් සම්මුඛ පරීක්ෂණ කමිටුව විසින් විධිමත් ව පරීක්ෂා කර නිසි පරිදි තහවුරු කරගෙන ලකුණු ලබා දිය යුතු අතර වෙනම ලේඛනයක එම අයදුම්කරුවන්ගේ තොරතුරු සටහන් කර තබාගත යුතු ය. එසේ ම, මේ සම්බන්ධ ලොග් සටහන් ද තබාගත යුතු ය.

7.4.2 වගන්තිය අවසානයේ සඳහන්, " **මෙම ගණය යටතේ පදිංචියට අදාළ ප්‍රධාන ලේඛන ඇත්නම් පමණක් මින් ඉදිරියට ඇති කොටස් සඳහා ලකුණු ලබා දිය යුතු ය.**" යන ඡේදය ඉවත් කෙරෙන අතර, ඒ වෙනුවට පහත ඡේදය ඇතුළත් කෙරේ.

**"මෙම ගණය යටතේ ඉහත කරුණුවලට අදාල ව පදිංචිය තහවුරු කිරීම සඳහා හිමිවන ලකුණු උපයා ඇති අයදුම්කරුවන්ට පමණක් මින් ඉදිරියට ඇති කොටස් සඳහා ලකුණු ලබා දිය යුතු ය."**

එන්.එච්. එම්. චිත්‍රානන්ද
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :
1. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්
2. නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්
3. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
4. විගණකාධිපති
5. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
6. විභාග කොමසාරිස් ජනරාල්
7. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
8. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්
9. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම ශාඛා ප්‍රධානීන්